# ශ්‍රී ලාංකීක කාපිරි ප්‍රජාව මුහුණ දෙන රැකියා අර්බුධයට විසඳුම් යෝජනා කිරීම වෙනුවෙන් සිදු කෙරෙන සමාජ විද්‍යාත්මක අධ්‍යයනයක්

(පුත්තලම දිස්ත්‍රික්කයේ සිරම්බිඅඩි ප්‍රදේශය ඇසුරෙන්)

*එච්.එම්.එන්.ටී. හේරත්* [1]

ලෝකයේ විවිධ උපසංස්කෘතීන් විසින් සාමූහික ව ජීවත් වීමට ඇති කරගත් පොදු එකගතාවේ ප්‍රතිඵලයක් වසයෙන් ගෝලීයකරණයත් සමග සංස්කෘතික විසරණය සිදු විය. අප්‍රිකානු-ශ්‍රී ලාංකිකයන් හෙවත් පොදුවේ ශ්‍රී ලාංකීය කාපිරි ප්‍රජාව වසයෙන් ප්‍රචලිත ජන කොටසක් දිගු කාලයක් තිස්සේ මෙරට වාසභූමි කරගෙන දිවි ගෙවන බව දන්නෝ සීමිත ය. මෙරට ප්‍රධාන සංස්කෘතියට අනුගත වීම, එම අනුවර්තනයේ දී පවා ඔවුන්ගේ උපසංස්කෘතික උරුමයන් නො නැසී පවත්වා ගැනීමට සමත් වීම මොවුන්ගේ සුවිශේෂීත්වය වේ. වහල් සේවය වෙනුවෙන් මෙරටට ආනයනය කළ මෙම කණ්ඩායම, වහල් සේවය නොමැති නූතනයේ රැකියා සහ යැපුම් මාධ්‍යය අහිමි වීමේ අර්බුදයට මුහුණ දෙන සංවර්ධනය විය යුතු දුර්වල ජීවන මට්ටමක පසු වෙති. මෙම ප්‍රජාවගේ රැකියා අර්බුදයට විසඳුම් යෝජනා කිරීම අධ්‍යයනයේ ප්‍රධාන අරමුණ වන අතර, විරැකියාව නිසා මුහුණ දී සිටින අවදානම් තත්ත්වය අනාවරණය කිරීමත්, ඔවුන්ගේ අනන්‍යතාව වන සංස්කෘතික ප්‍රතිමානයන් සහ ඇගයුම් පද්ධතිය අනාවරණය කිරීමත්, ඔවුන් සතු සම්පත් භාවිතයෙන් ආයෝජනය අවස්ථා ඉස්මතු කර ගැනීමට මග පෙන්වීම අධ්‍යයන අනුඅරමුණු වේ. ප්‍රාථමික සහ ද්විතීයක දත්ත දෙවර්ගය ම භාවිත කොට විස්තරාත්මක අධ්‍යයන ක්‍රමවේදය භාවිතයෙන් අධ්‍යයනය සිදු කර ඇත. අධ්‍යයනයෙන් අනාවරණය වූ පරිදි සංස්කෘතික හරස් වීම්, වාර්ගික මිශ්‍රවීම් මෙන් ම ගෝලීයකරණය මධ්‍යයයේ දීත් සංස්කෘතික ප්‍රතිමානයන් ආරක්ෂා කර ගනිමින් ප්‍රධාන සංස්කෘතියට අනුවර්තනය වීමට සමත් වූ ශ්‍රී ලාංකික එක ම ජන වර්ගය වේ. ඔවුන්ගේ ජන සංස්කෘතිය ජනප්‍රිය කොට ජන මාධ්‍යය, සංචාරක කර්මාන්තය, සුළු ස්වයං රැකියා පුහුණුව ඔස්සේ ඔවුන් විසින් මුහුණ දෙන විරැකියාවට පිළියම් යෝජනා කළ හැකි ය. මෙරට සංචාරක කර්මාන්තයේ සංවර්ධනයට සක්‍රීය කණ්ඩායමක් වසයෙන් ඔවුන් සම්බන්ධ කර ගැනීමට අවශ්‍ය ඉංග්‍රීසි ඇතුළු භාෂා පුහුණුව සහ නූතන තාක්ෂණික හුරුව වර්ධනය කළ යුතු වේ. මෙම සංවර්ධන කටයුතු සාර්ථක කරගැනීමට මග පෙන්වන විවික්ත පර්යේෂණවල හිඟතාව අවම කර ගැනීම වෙනුවෙන් නවක පර්යේෂකයන් අභිප්‍රේරණය කළ යුතු බව යෝජනා කෙරේ.

***ප්‍රමුඛ පදඃ*** අනුවර්තනය; අප්‍රිකානු-ශ්‍රී ලාංකිකයන්; උපසංස්කෘතිය; විරැකියාව; සංචාරක කර්මාන්තය

[1] ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය, බෙලිහුල්ඔය nirunditharushika@gmail.com